# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1951/25 – 2016 ජනවාරි 28 වැනි බ්‍රහස්පතින්දා – 2016.01.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2016 අංක 16 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/6/2015/HW/82.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ඩීඑස්ඩබ්ජ්/එල්එන්ඩී/4/ඒසීකිව්යූඅයි/එෆ්අයි/35.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් අමාත්‍ය මුනසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

2016 ජනවාරි මස 19 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.–** ප්‍රාදේශීය ලේකම්, වලස්මුල්ල.

2. **ඉඩමේ විස්තරය.** – දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු ගිරුවා පත්තුව සුළු කොට්ඨාසයේ බුවැල්ලෙගොඩ (අ.ග.පි. 156) රදනිආර (අ.ග.පි. 215) ගම්වල පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක H/WLS/RDA/2015/623 හා 2015.10.23 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම් :

01. **කැබලි අක්ෂර 'ඒ' – කරමැටියෙහේන – ප්‍රමාණය: හෙක්. 0.0019**
උතුරට: ප්‍රභාෂ් කුමාර ද සිල්වා කරුණානායක හිමිකම් කියන කරමැටියෙහේන; නැගෙනහිරට: ප්‍රභාෂ් කුමාර ද සිල්වා කරුණානායක හිමිකම් කියන කරමැටියෙහේන, නාඹටුන්න පල්ලියගේ කරුණාදාස සහ තවත් අය හිමිකම් කියන කරමැටියෙහේන සහ කැබලි අක්ෂර බී; දකුණට: කැබලි අක්ෂර බී සහ මාර්ගය (මා.සං.අ.); බටහිරට: මාර්ගය (මා.සං.අ.) සහ ප්‍රභාෂ් කුමාර ද සිල්වා හිමිකම් කියන කරමැටියෙහේන.

02. **කැබලි අක්ෂර 'බී' – කරමැටියෙහේන – ප්‍රමාණය: හෙක්. 0.0006**
උතුරට: කැබලි අක්ෂර ඒ, ප්‍රභාෂ් කුමාර ද සිල්වා කරුණානායක හිමිකම් කියන කරමැටියෙහෙන සහ නාඹටුන්න පල්ලියගේ කරුණාදාස සහ තවත් අය හිමිකම් කියන කරමැටියෙහේන; නැගෙනහිරට: නාඹටුන්න පල්ලියගේ කරුණාදාස සහ තවත් අය හිමිකම් කියන කරමැටියෙහේන, දඩල්ලගේ සුනිල් ද සිල්වා හිමිකම් කියන කරමැටියෙහේන සහ කැබලි අක්ෂර සී; දකුණට : අක්ෂර සී සහ මාර්ගය (මා.සං.අ.); බටහිරට: මාර්ගය (මා.සං.අ.) සහ කැබලි අක්ෂර ඒ.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

03. **කැබලි අක්ෂර 'සී' – කරමැටියෙහේන – ප්‍රමාණය: හෙක්. 0.0014**
උතුරට: කැබලි අක්ෂර බී, නාඔටුන්න පල්ලියගේ කරුණාදාස සහ තවත් අය හිමිකම් කියන කරමැටියෙහේන සහ දඩල්ලගේ සුනිල් ද සිල්වා හිමිකම් කියන කරමැටියෙහේන; නැගෙනහිරට: දඩල්ලගේ සුනිල් ද සිල්වා හිමිකම් කියන කරමැටියෙහේන, බුද්ධදාස ද සිල්වා හිමිකම් කියන කරමැටියෙහේන සහ කැබලි අක්ෂර ඩී; දකුණට : අක්ෂර ඩී සහ මාර්ගය (මා.සං.අ.); බටහිරට: මාර්ගය (මා.සං.අ.) සහ කැබලි අක්ෂර බී.

04. **කැබලි අක්ෂර 'ඩී' – කරමැටියෙහේන – ප්‍රමාණය: හෙක්. 0.0019**
උතුරට: කැබලි අක්ෂර සී, දඩල්ලගේ සුනිල් ද සිල්වා හිමිකම් කියන කරමැටියෙහේන සහ බුද්ධදාස ද සිල්වා හිමිකම් කියන කරමැටියෙහේන; නැගෙනහිරට: බුද්ධදාස ද සිල්වා හිමිකම් කියන කරමැටිහේන; දකුණට : අක්ෂර ඊ සහ මාර්ගය (මා.සං.අ.); බටහිරට: මාර්ගය (මා.සං.අ.) සහ කැබලි අක්ෂර සී.

05. **කැබලි අක්ෂර 'ඊ' – ප්‍රමාණය: හෙක්. 0.0010**
උතුරට: කැබලි අක්ෂර ඩී, බුද්ධදාස ද සිල්වා හිමිකම් කියන කරමැටියෙහේන සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ගය, බාලගේ කසුන් චතුරංග හිමිකම් කියන කරමැටියෙහේන සහ කැබලි අක්ෂර ජී; දකුණට : අක්ෂර ජී සහ මාර්ගය (මා.සං.අ.); බටහිරට: මාර්ගය (මා.සං.අ.) සහ කැබලි අක්ෂර ඩී.

06. **කැබලි අක්ෂර 'එෆ්' – මඩවලහේන – ප්‍රමාණය: හෙක්. 0.0109**
උතුරට: ජිනදාස අබේනායක හිමිකම් කියන මඩවලහේන සහ මාර්ගය (මා.සං.අ.); නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.); දකුණට : කිරම ඔය සහ ජිනදාස අබේනායක හිමිකම් කියන මඩවලහේන; බටහිරට: ජිනදාස අබේනායක හිමිකම් කියන මඩවලහේන.

07. **කැබලි අක්ෂර 'ජී' – කරමැටියෙහේන – ප්‍රමාණය: හෙක්. 0.0023**
උතුරට: මාර්ගය සහ බාලගේ කසුන් චතුරංග හිමිකම් කියන කරමැටියෙහේන; නැගෙනහිරට: බාලගේ කසුන් චතුරංග හිමිකම් කියන කරමැටියෙහේන, පට්ටිකාර බන්දනගේ තුසිත ලක්මාල් හිමිකම් කියන කරමැටියෙහේන සහ කැබලි අක්ෂර එච්; දකුණට : කැබලි අක්ෂර එච් මාර්ගය (මා.සං.අ.); බටහිරට: මාර්ගය (මා.සං.අ.) සහ කැබලි අක්ෂර ඊ.

08. **කැබලි අක්ෂර 'එච්' – කරමැටියෙහේන – ප්‍රමාණය: හෙක්. 0.0029**
උතුරට: කැබලි අක්ෂර ජී, බාලගේ කසුන් චතුරංග හිමිකම් කියන කරමැටියෙහේන සහ පට්ටිකාර බන්දනගේ තුසිත ලක්මාල් හිමිකම් කියන කරමැටියෙහේන; නැගෙනහිරට: පට්ටිකාර බන්දනගේ තුසිත ලක්මාල් හිමිකම් කියන කරමැටියෙහේන, අබේවික්‍රම කංකානම්ගේ ඉන්දික සඳරුවන් අබේවික්‍රම හිමිකම් කියන කරමැටියෙහේන සහ කැබලි අක්ෂර ජේ; දකුණට: කැබලි අක්ෂර ජේ, මාර්ගය (මා.සං.අ.); බටහිරට: මාර්ගය (මා.සං.අ.) සහ කැබලි අක්ෂර ජී.

09. **කැබලි අක්ෂර 'ජේ' – කරමැටියෙහේන – ප්‍රමාණය: හෙක්. 0.0030**
උතුරට: කැබලි අක්ෂර එච්, පට්ටිකාර බන්දනගේ තුසිත ලක්මාල් හිමිකම් කියන කරමැටියෙහේන සහ අබේවික්‍රම කංකානම්ගේ ඉන්දික සඳරුවන් අබේවික්‍රම හිමිකම් කියන කරමැටියෙහේන; නැගෙනහිරට: අබේවික්‍රම කංකානම්ගේ ඉන්දික සඳරුවන් අබේවික්‍රම හිමිකම් කියන කරමැටියෙහේන, හෙට්ටිආරච්චිගේ සමන් ජගත් කුමාර සහ මැද්දගේ දොන් හසිනි කෞශල්‍යා අමරනායක හිමිකම් කියන කරමැටිහේන සහ කැබලි අක්ෂර කේ; දකුණට : කැබලි අක්ෂර කේ මාර්ගය (මා.සං.අ.); බටහිරට: මාර්ගය (මා.සං.අ.) සහ කැබලි අක්ෂර එච්.

10. **කැබලි අක්ෂර 'කේ' – කරමැටියෙහේන – ප්‍රමාණය: හෙක්. 0.0110**
උතුරට: කැබලි අක්ෂර ජේ, අබේවික්‍රම කංකානම්ගේ ඉන්දික සඳරුවන් අබේවික්‍රම හිමිකම් කියන කරමැටියෙහේන, හෙට්ටිආරච්චිගේ සමන් ජගත් කුමාර සහ මැද්දගේ දොන් හසිනි කෞශල්‍යා අමරනායක හිමිකම් කියන කරමැටිහේන; නැගෙනහිරට: හෙට්ටිආරච්චිගේ සමන් ජගත් කුමාර සහ මැද්දගේ දොන් හසිනි කෞශල්‍යා අමරනායක හිමිකම් කියන කරමැටියෙහේන, කිරම ඔය සහ කැබලි අක්ෂර එල්; දකුණට : කැබලි අක්ෂර එල් මාර්ගය (මා.සං.අ.); බටහිරට: මාර්ගය (මා.සං.අ.) සහ කැබලි අක්ෂර ජේ.

11. **කැබලි අක්ෂර 'එල්' – කිරම ඔය – ප්‍රමාණය: හෙක්. 0.0076**
උතුරට: කැබලි අක්ෂර කේ, හෙට්ටිආරච්චිගේ සමන් ජගත් කුමාර සහ මැද්දගේ දොන් හසිනි කෞශල්‍යා අමරනායක හිමිකම් කියන කරමැටියෙහේන කිරම ඔය; නැගෙනහිරට: කිරම ඔය, නා ඔටුන්න පල්ලියගේ තිලකරත්න හිමිකම් කියන මුත්තෙට්ටුව හේන සහ කැබලි අක්ෂර පී; දකුණට : කැබලි අක්ෂර පී මාර්ගය (මා.සං.අ.); බටහිරට: මාර්ගය (මා.සං.අ.) සහ කැබලි අක්ෂර කේ.

12. **කැබලි අක්ෂර 'එම්' – කිරම ඔය – ප්‍රමාණය: හෙක්. 0.0050**
උතුරට සහ නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.); දකුණට : කැබලි අක්ෂර එන්, ලහඳ පුරගේ මල්ලිකා හිමිකම් කියන මුත්තෙට්ටුවහේන සහ කිරම ඔය ; බටහිරට: කිරම ඔය.

13. **කැබලි අක්ෂර 'එන්' – මුත්තෙට්ටුවහේන – ප්‍රමාණය: හෙක්. 0.0045**
උතුරට : කැබලි අක්ෂර එම් සහ මාර්ගය (මා.සං.අ.); නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.); දකුණට සහ බටහිරට: ලහඳ පුරගේ මල්ලිකා හිමිකම් කියන මුත්තෙට්ටුවහේන.

14. **කැබලි අක්ෂර 'පී' – මුත්තෙට්ටුවහේන – ප්‍රමාණය: හෙක්. 0.0111**
උතුරට : කැබලි අක්ෂර එල්, කිරම ඔය සහ නාඔටුන්න පල්ලියගේ තිලකරත්න හිමිකම් කියන මුත්තෙට්ටුවහේන; නැගෙනහිරට: නාඔටුන්න පල්ලියගේ තිලකරත්න හිමිකම් කියන මුත්තෙට්ටුවහේන, මහදුරගේ ගයාන් ලක්මාල් හිමිකම් කියන මුත්තෙට්ටුවහේන සහ කැබලි අක්ෂර කිව්; දකුණට කැබලි අක්ෂර කිව් සහ මාර්ගය (මා.සං.අ.); බටහිරට: මාර්ගය (මා.සං.අ.) සහ කැබලි අක්ෂර එල්.

15. **කැබලි අක්ෂර 'කිව්' – මුත්තෙට්ටුවහේන – ප්‍රමාණය: හෙක්. 0.0003**
උතුරට : කැබලි අක්ෂර පී, නාඔටුන්න පල්ලියගේ තිලකරත්න හිමිකම් කියන මුත්තෙට්ටුවහේන සහ මහදුරගේ ගයාන් ලක්මාල් හිමිකම් කියන මුත්තෙට්ටුවහේන; නැගෙනහිරට: මහදුරගේ ගයාන් ලක්මාල් හිමිකම් කියන මුත්තෙට්ටුවහේන; දකුණට මහදුරගේ ගයාන් ලක්මාල් හිමිකම් කියන මුත්තෙට්ටුවහේන සහ මාර්ගය (මා.සං.අ.); බටහිරට: මාර්ගය (මා.සං.අ.) සහ කැබලි අක්ෂර පී.

16. **කැබලි අක්ෂර 'ආර්' – මුත්තෙට්ටුවහේන – ප්‍රමාණය: හෙක්. 0.0001**
උතුරට සහ නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.); දකුණට සහ බටහිරට: උක්කුීය හේවගේ පියසේන හිමිකම් කියන මුත්තෙට්ටුවහේන.

02 - 352

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (ආ) අතුරු විධානය යටතේ ආඥාව

**2016 අංක 19 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2015/ඩබ්එස්/29.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 4/1/5/21.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (ආ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් අමාත්‍ය මුනසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ විස්තරව ඇති පරවශ්‍යතාවයට යටත්වන බව මෙම ආඥාවෙන් ප්‍රකාශයට පත් කරමි.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

2016 ජනවාරි මස 19 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩමේ විස්තරය.** – වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 834, කුරුණෑගල නගරය ඊසාන ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ කුරුණෑගල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක KU/KRN/2015/281 හා 2015.06.22 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0134 ක් පමණ වන පැරමවුන්ට් වත්ත නමැති ඉඩම් කැබැල්ලට මායිම් :

2. **පරවශ්‍යතාවේ විස්තරය.** – විසල් කුරුණෑගල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ ජල පවිත්‍රාගාරයේ ප්‍රවේශ මාර්ගය සඳහා ඉඩම් කොටසක පරවශ්‍යතාවය අත්කර ගැනීම.

01. **කැබලි අක්ෂර 'ඒ' – පැරමවුන්ට් වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0134 ක් පමණ**

උතුරට: එන්. එම්. ගමගේ හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස සහ මැගසින්කන්ද; නැගෙනහිරට: මැගසින්කන්ද, පාර සහ විවෘත මුඩු බිම; දකුණට : විවෘත මුඩු බිම සහ සූරතිස්ස මාවත; බටහිරට: සූරතිස්ස මාවත සහ එන්. එම්. ගමගේ හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස.

02 - 353

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2016 අංක 20 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2014/WS/140.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: කේඩීඑස්/එච්ඒආර්/4/2/1/45.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් අමාත්‍ය මුනසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

2016 ජනවාරි මස 19 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිළධාරි.** – ප්‍රාදේශීය ලේකම්, හාරිස්පත්තුව.

2. **ඉඩමේ විස්තරය.** – මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුළුගම්මන සියපත්තුව සුළු කොට්ඨාසයේ කොණ්ඩදෙනිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Maha/HRS/2014/464 හා 2015.05.23 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0069ක් පමණ වන කැටකැලගහහේන නොහොත් කිරිවල්ගොඩහින්න නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – කැටකැලගහ හේන නොහොත් කිරිවල්ගොඩහින්න – ප්‍රමාණය: හෙක්. 0.0069**

උතුරට: මහා භාරකාර සහ විහාරාධිපතීන් වහන්සේ කොණ්ඩදෙණිය රජමහාවිහාරය සහ ගාමිණීපාලිත රත්න හිමිකම් කියන කැටකැලගහ හේන නොහොත් කිරිවල්ගොඩහින්න; නැගෙනහිරට: මාර්ග (ප්‍රා.ස) සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් ඩිංගරියාදෙණිය; දකුණට : ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් ඩිංගරියාදෙණිය; බටහිරට: මහා භාරකාර සහ විහාරාධිපතීන් වහන්සේ කොණ්ඩදෙණිය රජමහාවිහාරය සහ ගාමිණී පාලිත රත්න හිමිකම් කියන කැටකැලගහ හේන නොහොත් කිරිවල්ගොඩහින්න.

02 - 354

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2016 අංක 21 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2014/WS/192.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: WAR/LAN/ACQUS/A2/5-49.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් අමාත්‍ය මුනසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

2016 ජනවාරි මස 19 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.** – ප්‍රාදේශීය ලේකම්, වරකාපොල.

2. **ඉඩමේ විස්තරය.** – සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බෙලිගල් කෝරළය සුළු කොට්ඨාසයේ 82ඒ තුල්හිරිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තුල්හිරිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක **KE/WRK/2015/106** හා 2015.08.14 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.1737ක් පමණ වන හපුගස්තැන්න ඕවිට නමැති ඉඩම් කැබැල්ලට මායිම් :

01. **කැබලි අක්ෂර 'ඒ' – හපුගස්තැන්න ඕවිට – ප්‍රමාණය: හෙක්. 0.1737**
උතුරට: මා ඔය; නැගෙනහිරට: හපුගස්තැන්නේ ඕවිට සහ මාර්ග (මා.සං.අ.); දකුණට : මාර්ග (මා.සං.අ.); බටහිරට: හපුගස්තැන්නේ ඕවිට වත්ත සහ මා ඔය.

02 - 355.

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (ආ) අතුරු විධානය යටතේ ආඥාව

**2015 අංක 215 දරන ආඥාව**

මගේ අංකය: 4/3/9/2012/WS/75.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය : නිප්‍රා/ඉ/03/03/16.

අංක 1944/11 හා 2015.12.07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 1ඒ පිටුවේ පළ කරන ලද 2015 අංක 215 දරන ආඥාවේ සඳහන් "38 වැනි වගන්තිය (අ) අතුරු විධානයෙන් " යන්න'' "38 වැනි වගන්තිය (ආ) අතුරු විධානයෙන්" යන්න ලෙසත් ''උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත් එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි. ''යන්න'' උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම්, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ විස්තරව ඇති පරවශ්‍යතාවයට යටත් වන බව මෙම ආඥාවෙන් ප්‍රකාශයට පත් කරමි." යන්න ලෙසත් නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

2016 ජනවාරි මස 19 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

02 - 356

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.